කොවිඩ් 19 සති පාසල -සබරගමුව

විෂය-ඉතිහාසය සතිය- 2 9ශ්‍රේණිය වාරය- 111 ඒකකය -05

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය

2021-සැප්තැම්බර් 06-සිට 2021 සැප්තැම්බරු 12

පැවරුම අංක 02

ක්‍රියාකාරකම -01 ශ්‍රී ලංකාවේ ඇති කළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හඳුනා ගනිමු(බ්‍රිතාන්‍ය පාලන සමය තුළ)

හැඳින්වීම- ක්‍රි.ව 1815 බ්‍රිතාන්‍යෝය් උඩරට රාජධානිය යටත් කර ගැනීමත් සමග එතෙක් මෙරට පැවති රාජාණ්ඩු පාලන ක්‍රමය බිඳ වැටුණි.එතැන් සිට 1948 වර්ෂයේ දී ශ්‍රී ලංකාව නිදහස් දින ගන්නා තෙක් වසර 133 ක කාලයක් බ්‍රිතාන්‍ය යෝ මෙරට පාලනය කලහ.ලාංකිකයන් නොකඩවා ගෙන ගිය උද්ගෝෂණ හේතුවෙන් වරින් වර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා දීමට බ්‍රිතාන්‍ය පාලකයන්ට සිදුවිය.එම ප්‍රතිසංස්කරණයන්ගෙන් සෑහීමකට පත් නොවූ ලාංකිකයන් දිගින් දිගටම ගෙනගිය උද්ගෝෂණවල ප්‍රතිඵලයක් ලෙස 1948 නිදහස දිනා ගැනීමට හැකිවිය.එතෙක් මෙරට බ්‍රිතාන්‍යන් විසින් හඳුන්වාදුන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මෙහිදී සාකච්ඡා කෙරේ.

- ගුණාත්මක යෙදවුම් -ඉතිහාසය පෙළ පොත/ ඉතිහාසය සටහන් පොත/පළාත් සහ ලකුණු කල ලංකා සිතියමක්/පාට පැන්සලක්
- ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස්

පියවර 01 -9 ශ්‍රේණිය පෙළ පොතෙහි 5 ඒකකය අවස්ථා දෙකක් හොඳින් හඬ නගා කියවන්න(පිටු අංක 97 සිට 114 දක්වා)

පියවර 02 ඉතිහාසය සටහන් පොත ගෙන ඉහත සඳහන් වන මාතෘකාව ලියා ගන්න(5 වන ඒකකයේ)

පසුව ඉහතින් දී ඇති හැඳින්වීම එහි සටහන් කර ගන්න.

පියවර 03-පසුව පහතින් දී ඇති ප්‍රශ්නාවලියට පිළිතුරු සපයන්න.එහිදී පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්නය සටහන් කර ගැනීම අත?්‍යවශ්‍ය වේ.ඒ සඳහා පිටු අංක 97 සිට 101 දක්වා උපකාර කර ගන්න.

ප්‍රශ්නාවලිය

බ්‍රිතාන්‍යයන් මෙරට බලය තහවුරු කර ගන්නා සමයේ මෙරට ක්‍රියාත්මක වූ පාලන ක්‍රමය කුමක්ද?

1828 පමණ වන විට බ්‍රිතාන්‍ය ආණ්ඩුවට මුහුණ දීමට සිදු වූ ආර්ථික ගැටලුව ලියා දක්වන්න.